**මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය - 2022**

**-----------------------------------------------------------------**

මහ කොළඹ අපජලය කළමනාකරණය ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහ නගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 සහ අංක 2558 දරන ව්‍යාපෘති ගිවිසුම්වල 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම්වලට අනුව එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාගර හා මිරිදිය ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ මිලියන 1.5 ක නාගරික හා උප නාගරික වැසියන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. (අ) මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (ආ) වත්කම් කළමණාකරණය, මූල්‍ය කළමණාකරණය, මෙහෙයුම් කාර්යසාධනය නියාමනය, පාරසරික නියාමන අනුකූලතාවය, පාරිභෝගික සේවා සහ නිසි සනීපාරක්ෂක සේවා සැපයීමේදී ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම (ඇ) ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහාය යනාදි සංරචක යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,597.11කට සමාන එජඩො මිලියන 110.24ක් වන අතර ඉන් රු.මිලියන 10,783.65කට සමාන එජඩො මිලියන 94.37ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,813.46කට සමාන එජඩො මිලියන 15.87ක් ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දින 2023 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම**

| | **නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 05 වගන්තිය | මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු වුවද 2022 වර්ෂය තුළදී මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පමණක්`පවත්වා තිබුණි. | 2022 ආරම්භයේ ඉන්ධන අර්බුදය සහ අමාත්‍යාංශයේ විෂය පථය නිරන්තරයෙන් වෙනස් වීම හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කර තිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් චක්‍රලේඛ උපදෙස් පරිදි පැවැත්විය යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති අංක 01/2019 දරන | වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු | අදහස් දක්වා නොමැත. | විගණන හා කළමනාකරණ කමිටු |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | රැස්වීම් හතරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | | රැස්වීම් නියමිත පැවැත්විය යුතුය. |
| (ඇ) | අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.7 සහ 07 වගන්ති | අකාර්යක්ෂමතාව හේතුවෙන් ව්‍යාපෘතිය තවත් වසර 08කින් දීර්ඝ කර ඇත. කාර්ය සාධනය ඇගයීමකින් තොරව නිලධාරීන් 12 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ලෙස රු. මිලියන 2.3ක් දීර්ඝකරන ලද කාල සීමාව තුළ ගෙවා තිබුණි | අදාළ කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාව ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට බෙහෙවින් බලපාන ලදී. කෙසේ වෙතත්, මෙම ප්‍රමාදයන් කාර්ය මණ්ඩලයේ අකාර්යක්ෂමතාව නිසා සිදු වූ බව නිවැරදි නොවේ. | චක්‍රලේඛ උපදෙස් අනුව ගෙවීම් සිදුකළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| **සංරචකය** | **2022 දෙසැම්බර් 31 දිනට** | | **විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදය සඳහා හේතු** |
|---|---|---|---|---|
| | **අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය** | **අත්කර ගන්නා ලද කාර්යසාධනය ප්‍රතිශතය** | | |
| <u>ප්‍රධාන මලාපවහන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම</u><br>අපජල පොම්පාගාරය සහ පොම්ප කිරීමේ ජාලය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම. | | | ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 9 වන දින ආරම්භ කර 2015 ජුනි 30 දින නිම කිරීමට නියමිතව තිබුණද, නිමකිරීමේ දිනය 2023 ජුනි 30 දක්වා 6 වතාවක් දීර්ඝ කර තිබුණි. | (අ) ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතා හේතුවෙන් ශක්‍යතා අධ්‍යයනය, පාරිසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලීන් ප්‍රමාද වීම සඳහා බලපාන ලදි.<br>(ආ) ප්‍රතිපත්ති සහයක කණ්ඩායමෙන් අපේක්ෂිත සහාය නොලැබීම.<br>(ඇ) කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය |
| **පොම්පාගාර** | | | | |
| වනාතමුල්ල | 100 | 99 | | |
| මාලිගාවත්ත | 100 | 77 | | |
| බොරැල්ල | 100 | 73 | | |
| බම්බලපිටිය | 100 | 99 | | |
| විවිස්වයික් | 100 | 76 | | |
| තිබිරිගස්යාය | 100 | 81 | | |
| සීඑස් 3 | 100 | 99 | | |
| කොම්පඤ්ඤවීදිය | 100 | 98 | | |
| **ප්‍රධාන පොම්පාගාර** | | | | |
| වනාතමුල්ල | 100 | 70 | | |
| විවිස්වයික් | 100 | 70 | | |

| | |
|---|---|
| **කළමනාකරණයේ අදහස් දැක්වීම** | නොවැළැක්විය හැකි හේතු සහ සම්මුතික බැඳීම් හේතුවෙන් කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන ලදි. කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය වේ. |
| **විගණකගේ නිර්දේශය** | අවශ්‍ය ගුණාත්මක මට්ටම සහතික කරමින් වැඩ කඩිනමින් නිම කිරීමට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරු පෙළඹවිය යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කොළඹ මහ නගර සභාවේ අපජල පොම්පාගාර සැලසුම් කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කොන්ත්‍රාත්තු අංක ජීසීඩබ්ලිව්එම්පී/ඒඩීබී/පීඑස්/01/අයිසීබී/වැඩ/03/2013 යටතේ යුරෝ 887,104 ක්, එජඩො 937,976 ක් සහ රු මිලියන 52.4ක් වටිනා අත්‍යවශ්‍ය අමතර කොටස් සැපයීමට එකඟ වී තිබුණි. කෙසේවෙතත්, 2022 දෙසැම්බර් 31 වන විට යුරෝ 739,906, එජඩො 777,736 සහ රු මිලියන 52.4 ක් වටිනා අත්‍යාවශ්‍ය අමතර කොටස් සැපයිව යුතුව තිබුණි. | අදහස් දක්වා නොමැත | දැනට සපයා ඇති අමතර කොටස් තොග සහ තවදුරටත් සැපයීමට නියමිත අමතර කොටස් සැපයීම සම්බන්ධයෙන් ව්‍යාපෘති කාර්යාලය සහ කොළඹ මහ නගර සභාව වහා පියවර ගත යුතුය. |

**3.3 උපයෝජනය නොකළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විට්ස්වයික් , බොරැල්ල, තිඹිරිගසාය, මාලිගාවත්ත යන පොම්පාගාර 04ක ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකිවීම හේතුවෙන් එම පොම්පාගාර 04 සඳහා 2016 වර්ෂයේදී රැගෙන එන ලද යන්ත්‍ර සහ උපකරණ 2022 දෙසැම්බර් 31 දින තෙක් එම පොම්පාගාරවල සවිකිරීමට නොහැකි ඇත. | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

**3.4 මතභේදයට තුඩුදෙන ගැටළු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ අංක 2557/2558 දරන ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 04 වැනි දින ආරම්භ කිරීමට නියමිතව තිබුණු අතර 2015 ජූනි 30 දින නිමකිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ අවසන් දිනය 2023 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව ව්‍යාපෘතිය නිම කිරීම මාස 96කින් ප්‍රමාද වී ඇත. | නොවැළැක්විය හැකි හේතු සහ සම්මුතික බැඳීම් හේතුවෙන් කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලුවලට කඩිනම් විසඳුම් ලබාදීමේ අරමුණින් කොළඹ මහ නගර සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශයේ සහ බස්නාහිර පළාත් සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රතිපත්ති සහයක කණ්ඩායමක් 2010 වර්ෂයේ සිට පත් කර 2022 දෙසැම්බර් 31 දිනට එම නිලධාරීන් වෙත රු. මිලියන 39.6ක් වැටුප් ලෙස ගෙවා ඇත. කෙසේවෙතත්, ගිවිසුම්ගත කාලසීමාව තුළ ණය මුදල භාවිත කළ නොහැකි වූ අතර ප්‍රතිඵලයක් ලෙස 2022 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගත් ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රු. මිලියන 120.5ක් ආසියානු සංවර්ධන බැංකුවට ගෙවීමට සිදුවිය. ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත ප්‍රතිපත්ති සහයක කණ්ඩායමෙන් සහයක් නොලැබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීමට අදාළ හේතු ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ පාලනයට යටත් නොවේ. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරීව දායක විය යුතු අතර ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබියදීත්, පොම්පාගාර 03ක් ඉදිකිරීම අත්හැර දමා තිබුණි. එසේ වුවද දේශීය මූල්‍යයනය යටතේ පොල්වත්ත පොම්පාගාරයේ ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. | අදාළ පොම්පාගාර අත්‍යවශ්‍ය නොවිය. | ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් විමර්ශනයක් කළ යුතුය. |

**3.5 වැඩබිම් පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විට්ස්ට්වයික්, බොරැල්ල, තිඹිරිගසාය සහ මාලිගාවත්ත යන පොම්පාගාර 04ක ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් තාවකාලික විසඳුමක් ලෙස බයිපාස් ක්‍රමයක් යටතේ අපජලය පොම්ප කිරීමට සිදුවන බවත් ඒ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ජනනය කිරීමට නොහැකි බවත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

**3.6 පෙර විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද නොවිසඳුනු ගැටළු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ජලාපවහන අංශයට හඳුන්වා දෙන ලද රු. මිලියන 3.2 ක් වටිනා මූල්‍ය කළමනාකරණ හා ගිණුම්කරණ පද්ධතිය 2017 වර්ෂයේ සිට නිෂ්කාර්ය තිබුණි. | නව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කොළඹ මහනගර සභාව විසින් කටයුතු කර ඇත. | විදේශ ආයෝජන ඵලදායී ලෙස භාවිත කිරීමට පියවර ගත යුතුයි. |

## 3.7 පාරසරික ගැටළු සම්බන්ධ නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| පොම්පාගාර තුනක ඉදිකිරීම් අවසන් කර කොළඹ මහ නගර සභාවට භාර දී තිබුණි. 2021 නොවැම්බර් 24 දින එම පොම්පාගාරයේ පූර්ව-ආරම්භ කිරීමේ පරීක්ෂණයේදී කොම්පඤ්ඤවීදිය පොම්පාගාරයේ දුර්වලතා පවතින බව අනාවරණය වී තිබුණි. ඉන් අනතුරුව ප්‍රධාන නල පද්ධතියට හානි සිදුව ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වූ අතර විවෘත ඇළ මාර්ගයක් ඔස්සේ බේරේ වැවට අපජලය මුදාහරිමින් පරිසර හානියක් සිදුවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ගුණාත්මක ඉදිකිරීම් සිදුකිරීමෙන් පරිසර හානිය වළක්වා ගත යුතුය. |